# බන්ධනාගාර මූලස්ථානය
## சிறைச்சாலைத் தலைமையகம்
## PRISON HEADQUARTERS

| දුරකථන<br>தொலைபேசி<br>Telephones | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2695204<br>4677177 | කොමසාරිස් ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner - General | 2691976 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 2695221<br>2692818 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2695206<br>4677180 |
|---|---|---|---|---|---|---|---|---|


දෙපාර්තමේන්තු චක්‍රලේඛ :- 17 /2019

මගේ අංකය / எனது இல. / My No ..........

ඔ12/08/වා.භා.ස/2019/19.

ඔබේ අංකය / உமது இல. / Your No ..........


150, බේස්ලයින් පාර,
කොළඹ 09.
150, பேஸ்லைன் வீதி,
கொழும்பு 09.
150, Baseline Road,
Colombo-09.


02-12-2019 .......20....

සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන්, සහකාර බන්ධනාගාර අධිකාරීන්.

**2019-12-31 දිනට අදාලව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකිරීම.**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේඅංක PFD/RED/03/03/01 හා 2016.03.31 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 පරිදි 2019 වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දැනුම් දෙමි..තව ද මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් , බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව පවත්වාගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් හා විධිමත් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින් වර සත්‍යාපනය කරණු ලබන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරණු ලබන කල් හි එසේ නිෂ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස් වලට අනුකූලව කරණු ලබන බවටත් සෑහීමකට පත් විය යුතුය.එසේම මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින තොරතුරු ප්‍රකාශ හා සමීක්ෂණ වාර්තා නිවැරදිව හා කලට වේලාවට ඉදිරිපත් කළ යුතුය.

1. 2020.03.15 දිනට පෙර භෞතිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරිම.
2. 2020.03.31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණයේ සමීක්ෂණ වාර්තාව මූලස්ථානය වෙත ඉදිරිපත් කිරිම .
3. 2020.04.15 දිනට පෙර සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත සසදා වාර්තා කිරිම සහ ක්‍රියාමාර්ග ගැනීම.
4. 2020.04.30 දිනට පෙර පොදු 47 වාර්තාවට අනුව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරිම,අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව, වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරිම හා වෙනත් රජයේ ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර අවසන් කිරිම.
5. 2020.06.15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිම.
6. 2020-06-30 දිනට පෙර අපහරණය කරණ ලද වත්කම් පිළිබද තොරතුරු, 2006.07.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 422 හි ඇමුණුම් ප්‍රකාරව ලේඛණගත කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරිම සදහා ඉදිරිපත් කිරිම.

ඉහත කාලසටහන අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් කිරිම වෙනුවෙන් එම කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ලිපි, චක්‍රලේඛ හා උපදෙස් පිළිබදව ද දැඩි අවධානය යොමු කරණ මෙන් කාරුණිකව දන්වමි.( මෙම චක්‍රලේඛය සමග පහත චක්‍රලේඛයන් ද දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය).

- බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ - අංක 26 / 2016 - 2016-10-25